# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2320/47 - 2023 පෙබරවාරි මස 22 වැනි බදාදා - 2023.02.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 පෙබරවාරි මස 22 වැනි දින
කොළඹ 01
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

**රෙගුලාසි**

1 මෙම රෙගුලාසි “ **2023 අංක 05 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි**” ලෙස හඳුන්වනු ලැබේ.

2. 2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/78 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරන ලද 2023 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි, මෙමගින් සංශෝධනය කෙරේ.

3. ඉහත සඳහන් කර ඇති 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල අංක 8 (ක) රෙගුලාසිය ඉවත් කර පහත සඳහන් නව රෙගුලාසි අංක 8 (ක) මගින් ආදේශ කර පහත පරිදි කියවිය යුතුය.

1A - PG 6249 — 376 (2023/03)
මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

"8 (ක) මෙම ගැසට් පත්‍රයේ එච්. එස්. කේත **3303.00.10, 3303.00.22, 3303.00.29, 3304.10, 3304.20, 3304.30, 3304.91, 3304.99, 3305.10, 3305.20, 3305.90, 3306.10, 3306.90, 3307.20** සහ **3307.49** යටතේ වර්ග කර I වන උපලේඛනයේ ලැයිස්තුගත කර ඇති භාණ්ඩ, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) ලියාපදිංචි වී ජාතික ඖෂධ නියාමන අධිකාරියෙන් (NMRA) ආනයන බලපත්‍රයක් ලබාගෙන ඇති ඕනෑම ආනයනකරුවෙකු විසින්, එම භාණ්ඩ ආනයනය කිරීමේ උපරිම වටිනාකම පසුගිය වසර 5ක කාලය තුළ එකී භාණ්ඩවල ආනයනික වටිනාකම මත පදනම්ව ගණනය කරනු ලබන වාර්ෂික සාමාන්‍ය මිල, රක්ෂණය සහ ගැල් කුලී (මි.ර.ගැ.) වටිනාකමින් 50%කට සීමා වූ අගයකට යටත්ව, ආනයන හා අපනයන පාලක ජනරාල්වරයාගේ පූර්ව අනුමැතිය මත ආනයනය කිරීමට අවසර ලබා දෙනු ලැබේ."

4. ඉහතින් සඳහන් කරන ලද 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල **I** වන උපලේඛනයෙන් පහත විස්තර කර ඇති භාණ්ඩ හා ඒවාට අනුරූප සටහන් මෙයින් ඉවත් කරනු ලැබේ.

| | I තීරුව **ශීර්ෂ අංකය** | II තීරුව **සංයෝජිත වර්ගීකරණ සංකේතය** | | III තීරුව **විස්තරය** | V තීරුව **තාවකාලික අත්හිටුවීම (TS) ආ ලැයිස්තුව** |
|---|---|---|---|---|---|
| **63** | **44.07** | | | **දික් අතට ඉරූ හෝ පැලූ කුට්ටි කළ හෝ පිට පොත්ත හරින ලද, යතු ගෑවා වූ හෝ වැලි කඩදාසි ඇල්ලුවා වූ හෝ අන්ත මුට්ටු කළා වූ (එන්ඩ්ජොයින්ට්ඩ්) හෝ එසේ නොකළා වූ මි.මී. 6 කට වැඩියෙන් ඝනකමක් ඇති දැව.** | |
| | | | - | අනෙකුත් : | |
| | | 4407.91 | -- | ඕක් ලීයෙන් කළා වූ (ක්වෙයාර්කස් විශේෂ) | **TS** |
| | | 4407.92 | -- | බීච් ලීයෙන් කළා වූ (පෙගැස් විශේෂ) | **TS** |

5. ඉහත රෙගුලාසිවලට අදාළව පැන නගින ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවසාන තීරණය, ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් ලබාදෙනු ලැබේ.

6. මෙම රෙගුලාසිවල අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත, වාණිජ බැංකු වෙත සහ වෙනත් අදාළ ආයතන වෙත "මෙහෙයුම් උපදෙස්" නිකුත් කරනු ලැබිය යුතුය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.